ඔබ එක් යුගයක සිංහල වේදිකාවත්, සිනමාවත් දෙකේ ඉදිරියෙන්ම හිටිය කෙනෙක්. ජනප්‍රිය නාට්‍ය වගේම චිත්‍රපටි ගණනාවක නිර්මාපකයෙක්. අපි ඈත අතීතයෙන් පටන්ගමු. ඔබ කොහොමද කලාවට යොමුවෙන්නේ ?

පොඩි කාලේ මම ටිකක් දඟ ළමයෙක්. හැබැයි මට සෙම නිසා නිතර හතිය තිබුණ නිසා ගෙදරින්ම ක්‍රීඩා තහනමක් පනවලයි තිබුණේ. ඒ නිසා මට වැඩිපුරම කරන්න ලැබුණේ ගෑණු ළමයින්ගේ ක්‍රියාකාරකම්. පෙරහැර යනවා. කවි, සින්දු කියනවා. සින්දු කියන්න හරි කැමතියි. ඒ කාලේ තාත්ත ළග වැඩකරන අය අවුරුද්දට මොනව හරි ලොකු තෑග්ගකුත් අරගෙන තාත්තට කතා කරලා යන්න එන සිරිතක් තිබුණා. එක වතාවක් මේ අය ගෙනත් තිබුණේ ග්‍රාමෆෝන් එකක්. ඉතිං ගෙදර නිතර සින්දු ඇහෙනවා. මම හිතන්නේ මම කලාවට යොමුවෙන්න මේ පසුබිම හේතුවෙන්න ඇති කියලා.

පාසල් කාලයේ වැඩි බරක් තිබුණේ අධ්‍යාපනයටද කලාවටද ?

මම ඉගෙන ගන්ඩ කොච්චර දක්ෂද කියනවා නම් අටේ පන්තියට යනකම් මට දිගටම ඩබල් ප්‍රමෝෂන් ලැබුණා. ඒ කියන්නේ ඒ කාලේ තිබුණා දක්ෂ ළමයින්ව පන්තියක් ඉහලින් දාන ක්‍රමයක්. එකේ පන්තියෙන් පස්සේ දෙකේ පන්තියෙට නෙවෙයි තුනට. තුනෙන් පස්සේ හතරට නෙවෙයි පහේ පන්තියට. ඔය විදිහට. කණිෂ්ටයයි ජ්‍යෙෂ්ටයයි දෙකම මම සමත්වුණා. ඒත් විශ්ව විද්‍යාල ගමන කෙරුණේ නෑ. මොකද මම ජ්‍යෙෂ්ටය විද්‍යා විෂයන් කළේ සිංහල මාධ්‍යයෙන්. තාත්තටි අයියටයි උවමන වුණා මට ඉංග්‍රීසි උගන්නලා ඉංජිනේරුවෙක් කරන්න. ඒ නිසා ජ්‍යෙෂ්ටයෙන් පස්සේ මාව මරදානේ ටෙක්නිකල් කොලිජියට දැම්මා.

ඒත් අන්තිමේ ඔබ ඩ්‍රෙස්සර් කෙනෙක් වුණෙත් නෑ. ඉංජිනේරුවෙක් වුණෙත් නෑ. නාට්‍යකාරයෙක්, චිත්‍රපටිකාරයෙක් වුණා. කොතනද ඒ හැරවුම් ලක්ෂය ?

ඉස්කෝලේ යන කාලේ මම නාට්‍ය කීපයක් ලියලා පාසල් වේදිකාවේ කරලා තිබුණා. ඒත් ප්‍රසිද්ධ වේදිකාවට එන්න මට උදව් වුණේ මගේ අයියා ධර්මා හඳුන්නේ. ටෙක්නිකල් කොලෙජ් යන කාලේ මම අයියත් එක්ක නැවතිලා හිටියෙ කොටහේනේ ගල්පොත්ත විදියේ ගෙදරක කාමරයක. අයියා දේශපාලනේට සම්බන්ධ වෙලා හිටිය නිසා ඒ කාලේ මරදානේ තිබුණ කාතිවල්වලට අයියට ආරාධනා ලැබෙනවා. අයියත් එක්ක මමත් යන නිසා මට කාතිවල්වල පෙන්නන ටිටර් බලන්න තිකන්ම අවස්ථාවක් ලැබුණා. මහොම ඉන්නකොට සැරයක් කොළඹ නගරාධිපති නන්දිසේන කූරේ මහත්තයාගේ කාතිවල් එකක ටිටර් දර්ශණයක ප්‍රධාන අමුත්තා විදිහට අයියට ආරාධනාවක් ලැබුණා. එදාට වෙන වැඩක් තියනවා කියලා අයියා වෙනුවට මට යන්න කියලා අයියා කිව්වා. මම ගිහින් බලාගෙන හිටියා බොහොම අමාරුවෙන්. අනේ මේ මොන ජරාවක්ද මිට වැඩිය හොඳ එකක් මට කරන්න පුළුවන්නේ කියලා මට හිතුණා. මාත් එක්ක ටිටර් එක බලන්න ඇවිත් හිටිය මගේ හොඳම යාළුව වෝල්ටර් විමලත්නට මම ඒක කිව්වා. මුලින්ම මගේ කීම විහිළුවකට ගත්ත වෝල්ටර් පස්සේ නාට්‍යයක් ලියන්න කියලා මාව උනන්දු කළා. පස්සේ එක රැයකින්ම 'කඳුළු' කියලා නාට්‍යයක් ලිව්වා. යාළුවෝ පස් දෙනෙක් එක්ක එකතුවෙලා කරපු මේ නාට්‍ය පනස් හයේ නොවැම්බර් 06 වෙනිදා බොරැල්ලේ වයිඑම්බීඒ එකේ පෙන්නුවා. ඒකෙන් තමයි මම ප්‍රසිද්ධ වේදිකාවට ආවේ. 'කඳුළු' කරාට පස්සේ ඒකට දායක වුණ අපි හන්දෙනෙක් එකතුවෙලා 'අනනුවර කලා පෙළ නාට්‍ය සංගමය' කියලා සංවිධානයක් පිහිටුවා ගත්තා. ඒකෙන් තමයි ඊළඟට නාට්‍ය කළේ.

නාට්‍ය සම්බන්ධයෙන් මොනවගේ අධ්‍යනයක්ද ඔබ ඒ වෙනකොට කරලා තිබුණේ ?

මුලින්ම වේදිකා නාට්‍ය කරන කොට නාට්‍ය ගැන විශේෂ අධ්‍යනයක් කරලා තිබුණේ නෑ. ටිටර්වල ලක්ෂණයි හිතුදි සිනමාවේ ලක්ෂණයි තමයි මගේ නාට්‍යවල තිබුණේ. 'කඳුළු' වලින් පස්සේ 'මනමාලකම' කියලා නාට්‍යයක් කළා. ඒකේ ශෛලිය නාට්‍යට වැඩිය සිනමාවටයි බර වුණේ. ඒක මම බලල තිබුණ ඉංග්‍රීසි චිත්‍රපටියක විදිහටයි කෙරුණේ. පස්සේ පස්සේ මම වැඩිපුර නාට්‍ය බලන්නත් නාට්‍ය ගැන ස්වයං අධ්‍යනයක් කරන්නත් යොමුවුණා. ඔය නාට්‍ය දෙක ප්‍රසිද්ධ වේදිකාවේ කළාට ඒවා නාට්‍ය විදිහට ඒතරම් උසස් තත්ත්වයක තිබුණේ නෑ. ඉතිං මට ඕනේ වුණා හොඳ වේදිකා නාට්‍යයක් කරන්න. ඒ නිසා අවුරුදු දෙක තුනක් නාට්‍ය ගැන ස්වයං අධ්‍යනයක යෙදිලා ඊට පස්ස කරපු නාට්‍ය තමයි 'සාමා' ඒකට සෑහෙන හොඳ ප්‍රතිචාරයක් ලැබුණා. ඒ කාලේ නාට්‍ය විචාර වැඩිපුර පළවුණේ ඉංග්‍රීසි පත්තරවල. ඒවත් විශ්ව විද්‍යාලවලින් කෙරෙන නාට්‍ය ගැන තමයි. එහෙම තියෙද්දි මෙන්න දවසක් මම දැක්කා ඩේලි නිව්ස් පත්තරේ 'සාමා' ගැන විචාරයක් පළවෙලා තියනවා. ආර්.එස්. කියන තමෙන් පළවෙලා තිබුණ ඒ විචාරයේ තිබුණා නාට්‍යකරණය ගැන තියන අඩු අවබෝධය ගිසා පහසුවෙන් මගහැර ගන්න තිබුණ අඩුපාඩු විශාල සංඛ්‍යාවක් නාට්‍යයේ තියනවා. ඒවා මගහැරගත්තානම් සිංහල නාට්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයට මේ නාට්‍ය හේතුවෙනවා කියලා. මේ ආර්.එස්. කියන්නේ කවුද කියලා බොහොම අමාරුවෙන් හොයාගත්තා. ඒ රෙජි සිරිවර්ධන. දවසක් කෝල් කරලා මම ඇහුවා කරුණාකරලා ඔබ නාට්‍යයේ දකින අඩුපාඩු මොනවද කියලා මට කියන්න පුළුවන්ද කියලා. පුළුවන් කියලා මට ගෙදරට එන්න කිව්වා. මම ගියාම බොහොම සුහදව පිළිඅරගෙන පපය ගානක් මාත් එක්ක කතා කළා. නාට්‍යයේ තියන අඩුපාඩුත් ඒවා මගහරවා ගන්න හැටත් කියලා දීලා කිව්වා අඩුපාඩු හදාගෙන නාට්‍ය පෙන්නන දවසක නාට්‍ය අනුමණ්ඩලයටත් දැනුම් දෙන්න කියලා. ඉතිං මමත් ඒ විදිහට කළා. නාට්‍ය අනුමණ්ඩලයෙන් පස්දෙනෙක් ආවා නාට්‍ය බලන්න. ඒ අතරින් මහාචාර්ය සරච්චන්ද්‍ර නාට්‍ය මැදදි නැගිටලා යන්න ගියා. අනෙක් හතර දෙනා නාට්‍ය ඉවරවෙනකම් බලලා නාට්‍ය අනුමණ්ඩලයේ ඊළඟ නාට්‍ය උළෙළට ඉදිරිපත් කරන්න නාට්‍ය සුදුසුයි කියලා නිර්දේශ කළා. 'සාමා' ට පස්සේ 'සක්තාවට්ටිය' කියලා නාට්‍යයක් කළා. ඒක බොහොම ජනප්‍රිය වුණා. පළවෙනි අවුරුද්දේ දර්ශණ වාර 100ක් කළා. ඒ විදිහට නිෂ්පාදනය කළ අවුරුද්දේ දර්ශණ වාර 100 සම්පූර්ණ කරපු අනෙක් නාට්‍ය දෙක සරච්චන්ද්‍රගේ 'මහමේ' නාට්‍යයයි, දයානන්ද ගුණවර්ධනගේ 'නරිබෑනා' නාට්‍යයයි විතරයි.

මේ විදිහට වේදිකාවේ ආ ගමන සිනමාවට මාරුවුණේ කොහොමද ?

'කලා පෙළ' සංවිධානය පිහිටවගෙන අපි නාට්‍ය හදන කාලේ මම ලිපිකරුවෙක් විදිහට කම්කරු දෙපාර්තමේන්තුවේ වැඩ කරනවා. 62 අවුරුද්දේ මට යාපනේට මාරුවක් ලැබුණා. ඒකෙන් නාට්‍ය කරන වැඩට බාධා ආවා. ඒ වෙලාවේ 'කලා පෙළේ' අපි තීරණය කළා චිත්‍රපටි හදන්න. මුලින්ම සාමා නාට්‍ය චිත්‍රපටියක් කරන්න තෝරගත්තා. කඩවත රන්මුතුගල ගමේ සති අන්තයේ තමයි මේකේ ෂූටිං කළේ. මම සිකුරාදා රෑ යාපනේ ඉඳලා කොළඹ එනවා. සෙනසුරාදා උදේම ලොකේෂන් එකේ. ඉරිදා ෂූටිං ඉවරවුණ ගමන් ආපහු යාපනේ යනවා. සඳුදා වැඩට. ඔය විදිහට තමයි 'සාමා' කළේ. ඒකට අත ගහනකොට අපේ සංගමේ ඉතුරුවෙලා තිබුණේ රුපියල් 250/-ක් විතරයි. ඒකෙන් පටන් අරගෙන කොහොම හරි අපි ෆිල්ම් එක ඉවර කළා.

පසු කාලීනව විශාල ජනප්‍රියත්වයකට උරුමකම් කියූ නලු නිලියන් රාශියක් ඔබ සිංහල සිනමාවට හඳුන්වලා දීලා සියනවා. විජය කුමාරණතුංග ඒ අතරින් එක් අයෙක්. කොහොමද විජය හමුවෙන්නේ ?

මම රෝමියෝ ජුලියට් කතාවක් චිත්‍රපටිය කරන්න නලු නිලියන් හොයන කාලේ තරුණයෙක් දවස් ගාණක් මගේ කාර්යාලයට අවිල්ලා තිබුණා මාව මුණගැහෙන්න. මට වැඩ වැඩි නිසා ඒ ගැන වැඩිය අවධානයක් තිබුණේ නෑ. දවසක් මගේ කාර්යාලේ වැඩ කරන කෙනෙක් ඇවිල්ලා මට කිව්වා අන්න අර හාදයා අදත් ඇවිල්ලා ඉන්නවා. කියව හරි මට කතා කරලා මිස ආපහු යන්නේ නෑ කියනවා කියලා. ඒ සැරේ මම එන්න කියන්න කියලා කිව්වා. අත් දිග ෂර්ට් එකක් ඇඳලා ටයි එකක් දාලා බොහොම ජේන්තුවට ඇදගත්ත කොණ්ඩෙ ක්වර්ල් හොඳ කඩවසම් ඉලංදාරියෙක් ඔන්න ආවා. එයාට චිත්‍රපටියක රගපාන්න ලොකු ආශාවක් තියනවා කියලා රෝමියෝ ජුලියට් කතාවෙ ප්‍රධාන චරිතය කරන්න ඉල්ලුවා. මගේ කතාවේ හැටියට ඒ චරිතයේ ඉන්නේ මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් තියන කොණ්ඩේ පැත්තට පීරපු තැනින් තැන ඉරුණු ඇඳුම් ඇඳගෙන ඉන්න බොහොම සාමාන්‍ය පිරිමියෙක්. ඉතිං මේ ඉලංදාරියා ඒ චරිතයට කොහොමටවත් ගැලපෙන්නේ නෑ. මම ඒ බව එයාට පැහැදිලි කරලා කිව්ව. ඊළඟට කරන චිත්‍රපටියක ගැලපෙන චරිතයක් දෙන්නම් කියල පිටත් කරලා අරියා. මෙන්න පහුවදා මම

13 වන පිටට

සූර්ය බල ශක්තිය
(SOLAR POWER)

පසුගිය දශකය තුල විශේෂයෙන් පසුගිය අවුරුදු 2 - 3 ඇතුලත ගෘහස්ථ සෝලා විදුලිබල භාවිතය ඉතා වේගයෙන් ඕස්ට්‍රේලියාව තුල වර්ධනය වී තිබේ.රජයෙන් ලබා දෙන දිරි දීමනා, තාක්ෂණය දියුනු වීම සහ නව සිළිකන් නිධි සොයා ගැනීම යනාදිය නිසා නිශ්පාදන වියදම පහල යාම මිට හේතු වී ඇත. සෝලා විදුලිබල පද්ධති දැන් ඕස්ට්‍රේලියානු පවුල්වල දැරිය හැකි විකල්ප බලශක්ති ප්‍රභවයක් වී හමාරය.

සවිකරන පැනල් ගණන අනුව දැනට ගෙවන විදුලි බිල, අඩු කරගැනීමට, නැතිකර ගැනීමට හෝ අමතර මුදලක් උපයා ගැනීමට හැකියාව තිබේ.

විවිධ මාර්ගවලින් ස්වයංපෝෂිත වීමට කැමති අයට දැන් තමාගේම විදුලියද නිපදවා ගැනීමට හැකියාව ලැබී තිබේ. මෙතෙක් ප්‍රයෝජනයට නොගත් වහලේ ඉඩ යොදාගනිමින් තමාට අවශ්‍ය පිරිසිදු සහ හරිත විදුලිය නිපදවා අතිරික්තය අධි මිලකට (Premium Rate) විකිණීමට හැකියාව තිබේ.

රජය මෙසේ විකල්ප බලශක්ති භාවිතයට උනන්දු කර වනුයේ දැනට ගල් අඟුරු මගින් නිපදවන විදුලියට ඇති ඉල්ලුම අඩුකර පරිසරයට වන හානිය අවම කිරීමටයි. ඕස්ට්‍රේලියානු රජයේ දිගු කාලීන අරමුන වනුයේ වසර 2020 වන විට විදුලිබල සැපයුමෙන් 20% පරිසරයට හානියක් නොවන විකල්ප බලශක්ති ප්‍රභවයන්ගෙන් (සූර්ය බලය, සුලං බලය යනාදියෙන්) ලබා ගැනීමයි.

සෝලා පැනල් මගින් හිරු එළියේ ඇති බලශක්තිය එකතු කර හරිත විදුලිය බවට පරිවර්තනය කරයි. ඉන්වර්ටර් නැමැති උකරණය මගින් මෙම DC විදුලිය (Direct Current) අප එදිනෙදා භාවිතා කරන AC (Alterative Current) බවට පරිවර්තනය කරයි. කිසිදු චලනය වන අමතර කොටස් නැති අතර, කිසිදු ශබ්දයක් නැත. විශේෂ නඩත්තු කිරීමක්ද අවශ්‍ය නොවේ.

කිසියම් මොහොතක සෝලා පැනල් මගින් නිපදවන විදුලිය එම මොහොතේ භාවිතයට අවශ්‍ය පමණට වඩා වැඩිනම් එම අතිරික්තය නිරායාසයෙන්ම ප්‍රධාන විදුලිබල ජාලයට මුදා හැරේ. ස්මාට් මීටරය මගින් මෙය ගණනය කරයි. සෝලා විදුලිය තිවසේ අවශ්‍යතා සඳහා පලමුව භාවිතා වන අතර අතිරික්තය පමණක් ජාලයට මුදා හැරේ.

ගිම්හානයේදී සෝලා විදුලිය නිපදවීම වැඩි අතර ශීත කාලයේදි සාපේක්ෂව අඩුවේ.

රජයෙන් ලබාදෙන දිරි ගැන්වීම්

මුලින් ලබාදෙන දීමනාව (Upfront Rebate)
මේ හේතුව නිසා සෝලා පද්ධතියට ඔබ ගෙවිය යුතු මුදල අඩුවේ.
මෙය STC (Small Trading Certificates) හා Solar credit මගින් ලැබේ.

අතිරික්ත විදුලිය අධිමිලකට මිලදී ගැනීම.

පාරිභෝගිකයින් 5000 වැඩි සෑම විදුලි සමාගමක්ම (electricity Retailer) තම සෝලා සවිකරන ලද පාරිභෝගිකයන්ට මෙම අධිමිල අතිවාර්යයෙන්ම ලබාදිය යුතු වේ. වික්ටෝරියා ප්‍රාන්තය තුල දැනට සෝලා සවිකර අධිමිල විසිසුමකට (Perineum Feed in tariff agreement) ඇතුලත් වන පාරිභෝගිකයන් හට වසර 2024 දක්වා එම අධිමිල නොකඩවා ලබා ගැනීමට අවස්ථාව තවමත් තිබේ.

කෙසේ වෙතත් රජය පැත්තෙන් මෙසේ විකල්ප බලශක්ති ඔස්සේ ලබාගැනීමට අපේක්ෂා කරන ඉලක්ක සපිරුනු වහාම දැනට ලබාදෙන මෙම ප්‍රතිලාභ අඩු කිරීම හෝ නවතාලීමට ඉඩ ඇත. එබැවින් ඔබ ඉහළ යන විදුලි බිල අඩුකර ගැනීමට අදහස් කරන්නේ නම් රජයෙන් ලබාදෙන ප්‍රතිලාභ උපරිම ලෙස ලබාගනිමින් සෝලා පද්ධතියක් සවිකර ගැනීම වාසි දායක වේ.

කාබන් බද්ද හේතු කොට ගෙන විදුලිය ගාස්තු තවත් ඉහළ යනු ඇත.

විවිධ වර්ගවල සෝලා පැනල් ඇති අතර ප්‍රධාන වශයෙන් සෝලා පැනල් වර්ග තුනකට බෙදා ඇත. (According to clean energy council Web site)

1. Mono Crystalline
2. Poly Crystalline (Multi - Crystalline)
3. Thin Film

මේ අතරින් Mono Crystalline පැනල් කාර්යක්ෂමතාවය අතරින් ඉදිරියෙන් සිටී. බොහෝවිට මෙම පැනල් සඳහා වසර 25 පමන විදුලි උත්පාදන වගකීමක් ලබාදේ.

ඕස්ට්‍රේලියාව තුල සෝලා පැනල්වලින් උපරිම කාර්යක්ෂමතාවය ලබාගැනීම සඳහා උතුරු දිශානු ගතව පැනල් සවිකල යුතුවේ.

තමන්ට ගැලපෙන සෝලා පද්ධතියේ තරම (system Size) තීරණය කල යුත්තේ තමන්ගේ දැනට විදුලිය පරිභෝජනයත්, මේ සඳහා කොපමණ වියදම් කිරීමට සූදානම්ද සහ වහලේ ඉඩ ප්‍රමාණය යන කරුණු පදනම් කරගෙනය.

සෝලා පද්ධතිය වහලේ සවිකල යුත්තේ ඒ සඳහා සුදුසුකම් ලැබූ අනුමත විදුලි කාර්මිකයකු විසිනි. (Qualified Clean energy council accredited installer)

සෝලා පද්ධතියට ඇතුලත් වන පැනල් ඉන්වර්ටර් ඇතුළු උපාංග ඕස්ට්‍රේලියන් ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

සම්පත් සාර
0433 121 057
sampathsaara@gmail.com